සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

8 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 නාට්‍යයක තේමාව යනුවෙන් අදහස් කරන්නේ,

(1) නාට්‍යයේ ඇති ගැටුම ය. (2) නාට්‍යයේ නම ය.

(3) නාට්‍යයෙන් ඉදිරිපත්වන අදහස ය. (4) නාට්‍ය පෙළෙන් ප්‍රකාශවන අදහස ය.

02 සාත්වික අභිනය යනුවෙන් හඳුන්වන්නේ,

(1) මුහුණ අංගරචනය කිරීමයි.

(2) අංග, ප්‍රත්‍යංග, උපාංග දැක්වීමයි.

(3) මුහුණේ ඉරියව් මගින් අදහස් ප්‍රකාශ කිරීමයි.

(4) වේදිකාවට පරිබාහිර දේවල් තුළින් අදහස් ප්‍රකාශනයයි.

03 නාට්‍යෝපකරණ, අංගරචනය ආදිය අයත් වන්නේ,

(1) වාචික අභිනයට (2) ආහාර්ය අභිනයට (3) සාත්වික අභිනයට (4) ආංගික අභිනයට

04 රංග ක්‍රීඩාවකින් ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,

(1) ක්ෂණික ව ක්‍රියාත්මක වීම. (2) මනස සැහැල්ලු වීම.

(3) නායකත්වයට හුරුවීම. (4) සබකෝලය මගහරවා ගැනීම.

05 පරිකල්පන අභ්‍යාසයක් වන්නේ,

(1) අංක ක්‍රීඩාව (2) වෙද පුටුව (3) නායකයා සෙවීම (4) ගස් දෙකේ යුද්ධය

06 අංග රචනය බෙදෙන කොටස් වන්නේ,

(1) ලෝකධර්මී, නාට්‍ය ධර්මී, මිශ්‍ර (2) නළල, ඇස, කම්මුල්, කට, නිකට, නාසය

(3) නළල, උරහිස, ප්‍රත්‍යාංග, උපාංග (4) සරල හා චරිතාංග, උපාංග

07 මව්පියෝ නිදහස් වෙන්නටා

මාව දුන්නයි නාකි වූ හමෙකුටා

උන්දල හට කඹුරන්නටා

යැද ඉන්නේ සුරන් හට දොස්කොටා

ඉහත කවිය

(1) කෝලම් ගීයකි. (2) සොකරි ගීයකි. (3) ශාන්තිකර්ම ගීයකි. (4) යාග කවියකි.

08 උසස් කුල උපතත්

දහස් ගම්බිම් තිබුණත්

පිරිස් බල සිටියත්

උසස් නැත සිප්සතර නැතහොත්

මෙම කවිය දැක්වෙන ග්‍රන්ථය වන්නේ,

(1) යාග ගී (2) සිරිත්මල්දම (3) බැලසන්ත නාඩගම (4) කෝලම් ගී

09 පරිකල්පනය යනුවෙන් අදහස් කරනු ලබන්නේ,

(1) අලුතින් යමක් සිතීම හා මවාගෙන ඉදිරිපත් කිරීමයි.

(2) විවිධ අවස්ථාවන් අනුකරණයයි.

(3) ඇති දෙය ඇති සැටියෙන් ම ඉදිරිපත් කිරීමයි.

(4) ක්ෂණිකව චරිතයක් ඉදිරිපත් කිරීමයි.

10 සංවාද භාවිත නොකළ ද ඉන් ඔබ්බට වචන ඉක්මවා යන සියුම් ප්‍රකාශන ශක්තියක් ඇත්තේ,

(1) අනුකරණ රංගනයේ ය. (2) ක්ෂණික නිරූපණයේ ය.

(3) අනුරූපණ රංගනයේ ය. (4) අභිරූපණ රංගනයේ ය.

11 අංග රචනය යනුවෙන් අදහස් කරනු ලබන්නේ,

(1) මුහුණ පමණක් චරිත නිරූපණයට අනුව සිදුකරන වෙනස්කම් ය.

(2) සිරුරේ අංගෝපාංගයන්ට අනුව කරන රඟපෑමේ වෙනස්කම් ය.

(3) මුහුණ ප්‍රධාන කොටගෙන බාහිර ස්වරූපයෙහි වන වෙනස්කම් ය.

(4) නාට්‍ය ශෛලිය අනුව නළු නිළි ඇඳුම්වල සිදුකරන වෙනස්කම් ය.

12 චරිතවල අභ්‍යන්තර හා බාහිර ලක්ෂණ නිරූපණය කළ හැකි නළුවන් තෝරා ගැනීම යනු,

(1) පෙළ රචනයට ය. (2) රංග භූමි පාලනයට ය.

(3) නළුවරණයට ය. (4) අංග රචනයට ය.

13 'සෝබාවදේ මෙපුර සිරි විසිතුරු බලනු මිතුරු' නාට්‍ය ගීතය ඔබ පන්තියේ සිදුකර ඇත. එම ගීතයට අදාළ වන නාට්‍ය සංගීතය අයත් වන්නේ,

(1) වාචික අභිනයට ය. (2) ආහර්ය අභිනයට ය.

(3) සාත්වික අභිනයට ය. (4) ආංගික අභිනයට ය.

- **පහත විස්තර ආශ්‍රයෙන් අංක 14 සිට 17 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A අලුතින් යමක් සිතින් මවා ගැනීම.

දෑනුම, කුසලතා, ආකල්ප මත රැඳීම.

අපූර්ව නිර්මාණ බිහිවීම.

B සරල තනුවකට අනුව නිර්මාණය වීම.

අදහස මතුවන පරිදි හැඟීම් ප්‍රකාශය

ආහාර්ය අභිනයට අයත් වීම.

C ප්‍රබල සංවාද ඇතුළත් වීම.

රංග විධාන ඇතුළත් වීම.

ගැටුම් සහිත ව පෝෂණය වීම.

D වෙස්සන්තර ජාතක කථාව

නවරාත්‍රී මංගල්‍යය

අකීකරු පුත්‍රයාගේ උපමා කතාව

14 නාට්‍ය පිටපතට අදාළ වන්නේ,

(1) A (2) B (3) C (4) D

15 පරිකල්පනයට අදාළ කරුණු ඇතුළත් වන්නේ,

(1) A (2) B (3) C (4) D

16 නාට්‍ය ගීතයට අදාළ කරුණු ඇතුළත් වන්නේ,

(1) A (2) B (3) C (4) D

17 විවිධ ආගමික උත්සව ඇතුළත් වන්නේ,

(1) A (2) B (3) C (4) D

18 ජාතක කථා මෙන් ම වෙනත් ආගමික කථා යොදා නාට්‍ය නිර්මාණයට නිදසුන් වන්නේ,

(1) සුබ සහ යස
(2) පොල් ගෙඩියට ජරමරේ
(3) සාන්තුවර සෙබලානෝ
(4) විජය කුවේණි

19 නාට්‍ය පෙළ ගැන නිවැරදි නොවන්නේ,

(1) නාට්‍ය පෙළ වෙනස් කිරීම නිෂ්පාදක සතුය.
(2) නාට්‍ය පෙළ මුළු නාට්‍යයේ සාර්ථක අසාර්ථක බව පෙන්වයි.
(3) නාට්‍ය පෙළක සාර්ථකත්වයේ සාධක වන්නේ සංවාදයයි.
(4) නාට්‍ය පෙළක සංවාද භාවිත කළ හැක්කේ එක් ශෛලියකට පමණි.

20 ළමා නාට්‍ය තේමා වන්නේ,

(1) තාරුණ්‍යයේ ස්වභාවය ඉදිරිපත් කෙරේ.
(2) ළමා ලෝකය නිරූපණය කෙරේ.
(3) ළමා සංකල්ප ඉදිරිපත් කරයි.
(4) වැඩිහිටියන් විසින් ළමයින් සඳහා ඉදිරිපත් කෙරේ.

# II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකක් ඇතුළත්ව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01 ''මම මේ මහා මූකලානේ එහා ගම්මානේ. මමයි ආච්චියි විතරයි ගෙදර ඉන්නෙ.''

(i) ඉහත සංවාද ඛණ්ඩය අයත් නාට්‍යයේ නම කුමක් ද? (ල. 01)

(ii) එහි නිර්මාණ ශිල්පියා නම් කරන්න. (ල. 01)

(iii) මෙම නාට්‍යයේ තේමාව කුමක් ද? (ල. 02)

(iv) මෙම නාට්‍යයෙන් ඔබට ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න. (ල. 02)

(v) මෙම නාට්‍යයේ කතා පුවත කෙටියෙන් ලියන්න. (ල. 04)

02 (i) අංග රචනය යන්න හඳුන්වන්න. (ල. 02)

(ii) අංග රචනයේ දී භාවිතා කරන ද්‍රව්‍ය 4 ක් නම් කරන්න. (ල. 04)

(iii) අංග රචනයේ දී අවධානය යොමුකළ යුතු කරුණු විස්තර කරන්න. (ල. 04)

03 (i) කතාන්දරයක් හා නාට්‍යයක් අතර පවතින සමානතා හා අසමානතා 3 ක් ලියන්න. (ල. 03)

(ii) ඔබ දන්නා ජනකතාවක් කෙටියෙන් ලියන්න. (ල. 03)

(iii) එම ජන කතාව නාට්‍යයකට ගතහොත් විශේෂ කරගත යුතු කරුණු මොනවා ද? (ල. 04)

04 (i) ඔබ පන්තිකාමරයේ ප්‍රායෝගික ක්‍රියාකාරකමක් ලෙස කරන ලද රංග අභ්‍යාස තුනක් නම් කරන්න. (ල. 03)

(ii) එම රංග අභ්‍යාසයක් සිදුකළ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

(iii) රංග අභ්‍යාස සිදුකිරීම තුළින් නළුවාට ලැබෙන ප්‍රයෝජන 4 ක් ලියන්න. (ල. 04)

05 (i) අනුෂංගික කලා අංග යන්න හඳුන්වන්න. (ල. 02)

(ii) ඒ අතරින් නාට්‍යෝපකරණ නිර්මාණකරණයේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද? (ල. 03)

(iii) ඔබ නිර්මාණය කරන ලද නාට්‍යෝපකරණයක රූප සටහනක් ඇඳ පියවරෙන් පියවර විස්තර කරන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 4 | (02) | 3 | (03) | 2 | (4) | 1 | (05) | 2 | (06) | 2 | (07) | 1 | (08) | 2 |
| (09) | 1 | (10) | 4 | (11) | 3 | (12) | 3 | (13) | 2 | (14) | 3 | (15) | 1 | (16) | 2 |
| (17) | 1 | (18) | 3 | (19) | 4 | (20) | 2 | | | | | | | | |

## II කොටස

01 (i) වළහා මාෂා (ල. 01)

(ii) ඩී. කුමාරගේ (ල. 01)

(iii) දෙමාපියන්ට අකීකරුවීමේ ඵල විපාක, අවිහිංසාවාදය (ල. 02)

(iv) අකීකරු නොවීම, අවිහිංසාවාදී වීම. (ල. 02)

(v) කතා පුවත කෙටියෙන් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 04)

02 (i) මුහුණ ප්‍රධාන කොටගෙන ප්‍රේක්ෂකයාට පෙනෙන කොටස චරිතයකට ගැලපෙන පරිදි රචනා කිරීමේ කලාවයි. (ල. 02)

(ii) පෑන්ක් කේක්, ලිප්ස්ටික්, අයිබ්‍රෝ පෙන්සිල්, ටූත් එනමල් (ල. 04)

(iii) නාට්‍යයේ ශෛලිය, චරිතයේ ස්වභාවය, සමෙහි පැහැය, අනිකුත් ආනුෂංගික කලා (ල. 04)

03 (i) සමාන අසමානතා 3 ක් ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 03)

(ii) ජනකතාවක් කෙටියෙන් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 03)

(iii) නාට්‍යෝචිත අවස්ථා මතුකිරීම / අනවශ්‍යය කොටස් ඉවත්කිරීම / මූලික රසයට හානියක් සිදුනොකිරීම / මුල, මැද, අග පිළිවෙල ඇතුලත් කිරීම අත්‍යවශ්‍ය නොවන බව (ල. 04)

04 (i) ස්වසන අභ්‍යාස, ශිථිලකරණ අභ්‍යාස, දර්පණ අභ්‍යාස (ල. 03)

(ii) එක් අභ්‍යාසයක් සිදුකළ ආකාරය කෙටියෙන් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 03)

(iii) මානසික ඒකාග්‍රතාවය, පරිකල්පන හැකියාව, ශාරීරික නම්‍යශීලී බව, සංවාද උච්චාරණය (ල. 04)

05 (i) නළුවාට පරිබාහිරව යොදාගනු ලබන සියලුදේ අනුෂාංගික අංග වේ. (ල. 02)

(ii) නාට්‍යය ශෛලිය, සරල වීම, පරිහරණයේ පහසුව, රංගනයට අවහිර නොවීම. (ල. 03)

(iii) දළ රූප සයහනක් ඇඳ විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 05)